**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**
**-----------------------------------**

1 මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2018 මාර්තු 20 සිට 2018 දෙසැම්බර්31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 04 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 03 දිනද, සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| (i) | ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කල යුතු වේ. | පිළිගතිමි. |
| (ii) | විගණන ගාස්තු,උසාවි දඩ ආදායම්,මුද්දර ගාස්තු ආදායම් හා වෙනත් වියදම් උපචිත පදනම මත ගිණුම් තබා නොතිබුණි. | උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ---------------- |
| (i) | පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි අයිතම 12 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි සියල්ලගේ වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කල යුතු වේ. | වටිනාකම හඳුනාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. |
| (ii) | පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ආරම්භක හිඟ උසාවි දඩ ශේෂය රු.1,213,623 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ආරම්භක ශේෂය නිවැරදිව ගිණුම්වලට ගත යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2018 වර්ෂයේ අප්‍රේල් සිට ජූලි දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු.1,121,499 ක් වූ උසාවි දඩ ආදායම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | කාලච්ඡේදයට අදාල නිවැරදි ආදායම් ගිණුම්වලට ගත යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2018 මාර්තු 19 දිනට පෙර තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ පැවති උසාවි දඩ හිඟ මුදල්වලින් පොළොන්නරුව මහා නගර සභාවට රු.5,970,691 ක මුදලක් ලැබී තිබුණද, එයින් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට අදාල රු.1,351,764 ක මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (v) | 2018 වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | හඳුනාගෙන ඇත. |
| (vi) | ආරම්භක ණයහිමි ශේෂයේ ඇතුලත් රු.189,927 ක් සඳහා ගෙවීම් කිරීමේදී වැය විෂය හර කර තිබුණි. මේ හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය සහ වර්ෂයේ වියදම එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | ගෙවීම් ණයහිමි ගිණුමේසටහන් කල යුතුවේ. | නිවැරදිකර ඇත. |
| (vii) | පොළොන්නරුව මහා නගර සභාව වෙත ගෙවිය යුතුව තිබූ රු.2,512,622 ක අත්තිකාරම් මුදල බැරකම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | නිසි පරිදි බැරකම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (viii) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සේවයේ යෙදවීමට අදාළ හිඟ ආදායම් රු.30,800 ක් ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ ආදායම් නිසි පරිදි ගිණුම්ගත කල යුතු වේ. | පිළිගනිමි. |

(ඈ) නොසැසඳුනු ගිණුම්

-------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ---------------- |
| (i) | ගලිබවුසර් ආදායම් ලේඛනය අනුව සමාලෝචිත කාලච්ඡේදයේ ආදායම රු.72,025 ක් වූ අතර සේවා ඉල්ලුම්පත් ලිපිගොනුව අනුව ගණනය කරන ලද ආදායම රු.155,842 ක් විය. | ආදායම් ලේඛන හා ගොනු යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. | ලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ පොදු අරමුදලේ ශේෂය රු.6,183,172 ක් වුවත් ප්‍රා.ස.10 ට අනුව එය රු.9,994,020 ක් වූයෙන් රු.3,810,848 ක නොසැසඳීමක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් ප්‍රා.ස. 10 ට සමාන විය යුතු වේ. | ඉදිරියේදී නොසැසඳීම් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැති හා කර්මාන්ත ණයහිමි ලෙස දක්වා තිබූ වටිනාකම රු.1,709,849 ක් වූ ශේෂ 10 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කල යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

--------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ---------------- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.105,587,938 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම
-------------------
නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------
නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | | | |
| (i) | 59 රීතිය | සෑම වර්ෂයකම ආරම්භයේදී ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තු පිළියෙළ කර නොතිබුණි. | කර්මාන්ත පිළිබඳව සමීක්ෂණයක් පවත්වා ලැයිස්තු පිළියෙල කල යුතු වේ. | පිළිගනිමි. |
| (ii) | 203 හා 204 රීති | සභාවේ දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් කල යුතු වේ. | ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු.රෙ.571,572 | තැන්පත් කර වසර 02 ඉක්මවූ රු.280,544 ක් වටිනා කර්මාන්ත තැන්පත් ශේෂ 26 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මු.රෙප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ආදායමට ගැනීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.1646 | සියලුම වාහනවල දෛනික ධාවන සටහන් හාමාසික සාරාංශවිගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කල යුතු වේ. | වාහන කිහිපයක යවා ඇති අතර ඉතිරි වාහනවලද ධාවන සටහන් පත් යැවීමට කටයුතු කරමි. |
| (ඇ) | වෙනත්චක්‍රලේඛ<br>--------------------- | | | |
| (i) | 2002 නොවැම්බර් 28 දිනැතිඅංක අයිඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කල යුතු වේ. | ඉදිරියේදී ආරම්භ කිරීමට කටයුතු කරමි. |

2 මූල්‍ය සමාලෝචනය
--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 20 සිට දෙසැම්බර් 31 දක්වා කාලච්ඡේදය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,531,568 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ඇස්තමේන්තු ආදායම්,තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
-------------------------------------------------------------

සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,402,059 | 957,857 | 802,790 | 1,885,648 |
| කුලී | 224,776 | 266,958 | 266,958 | - |

| | | | | |
|---|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු | 500,000 | 184,090 | 437,855 | - |
| වෙනත් ආදායම් | 1,412,650 | - | 1,624,569 | - |
| | ------------- | ------------- | ------------- | ------------- |
| | 3,539,485 | 1,408,905 | 3,132,172 | 1,885,648 |
| | ======== | ======== | ======== | ======= |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| ගණන්ගොල්ල ප්‍රදේශයේ වරිපනම් පනවන ලද ඒකක 241 ක් අතුරින් ඒකක 171 කින් කිසිදු වරිපනම් ගාස්තුවක් අයවී නොතිබුණි. | දියුණු කල ප්‍රදේශවලින් වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කල යුතු අතර, වරිපනම් අයකරනු ලබන ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සපයාදීමට කටයුතු කල යුතු වේ. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) ජල බදු | | |
| තමන්කඩුව ප්‍රාදේශීය සභා වත්කම් බෙදාහැරීමේදී පොළොන්නරුව ප්‍රාදේශීය සභාව වෙත පැවරුණු හිඟ ජලබදු රු.347,132 කින් 2018 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් හිඟව පවතින ජලගාස්තුව රු.197,407 ක් විය. | හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු වේ. | දැනට හිඟයෙන් 50% ක් අයකර අවසන්ය. |
| (ඇ) කඩ කුලී | | |
| පොළොන්නරුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී තිබූ සේවාගම පිහිටි කඩකාමර 10 ක් ගරා වැටී තිබීම හේතුවෙන් සභාව වෙත කඩකුලී ආදායම් අයකරගත නොහැකි වී තිබුණි. | කඩ කාමර අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ ඉවත් කිරීමට කටයුතු කල යුතු වේ. | එම ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මූලික කටයුතු කර ඇත. |
| (ඇ) බලපත්‍ර ගාස්තු | | |
| බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ දුරකථන කුළුණු 09 කින් ගාස්තු අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

3.1 කාර්යසාධනය
---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණය,පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ක්‍රියාකාරී සැලැස්ම** | | |
| | පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 52 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ඉටු කිරීමට අපේක්ෂිත කර්තව්‍යන් වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කල යුතු වේ. | අතුරු ව්‍යවස්ථා වලට අදාළ ක්‍රියාකාරී සැලැස්මක් සැදීමේ නෛතික විධිවිධානයක් නැත. ක්‍රියාකාරී සැලැස්මක් ඇත. |
| (ආ) | **තිරසර සංවර්ධන අරමුණු** | | |
| (i) | එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණ ද එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගත යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. |
| (ii) | අයවැය සකස් කිරීමේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජූලි 31 දිනැති අංක BD/CBD/4/1/2-2018 චක්‍රලේඛයෙන් හඳුන්වා දී තිබුණු දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | නියමිත පරිදි දත්ත රැස්කල යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. |
| (iii) | ඉලක්ක කරා ළඟාවීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා වූ සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබු බැවින් දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් නොතිබුණි. | නියාමනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. |
| (iv) | 2016, 2017 හා 2018 වර්ෂවල තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසිය යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (v) | ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයන් නොපැවති අතර අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | පුහුණුවීම් ලබාදිය යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ හා සමුච්චිත අරමුදල් ගිණුම්වල ශේෂයන් සහ නිර්දේශ වාර්තාව මඟින් බෙදා වෙන් කරන ලද ශේෂයන් අතර රු.72,515,187 ක නොසැසඳීමක් පැවතුණි. | නොසැසඳීම පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. | නොසැසඳීම පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ අනුමත තනතුරුවල පුරප්පාඩු 20 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කරදෙන ලෙස පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |
| (ආ) | මෝටර් රථ හා යන්ත්‍රෝපකරණ 20 ක් සභාව සතුව පවතින නමුත් ඒවායේ සේවය සඳහා සිටිනුයේ රියදුරන් 04 ක් පමණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු වේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ මූල්‍ය මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කල යුතු වේ. | මාර්තු 30 දින වන විටත් වගකීම් බෙදාදුන් වාර්තා ලැබී නොතිබීම |

| | | |
|---|---|---|
| 2019 මැයි 30 දින දීය. | | හේතුවෙන් ප්‍රමාද විය. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------- |
|---|---|---|
| උතුරුමැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සීපී/සීඑස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු වුවද, 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කල යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |